


## සිත්තර පප්පා හෙවත් අපහාස ඉවතලා උපහාස සමාජගත කල ලාංකීය කාටූනයේ ගෘහපති කැමිලස් පෙරේරා

කිරි මණ්ඩලේ කල්කිරි බෝතලය ගත්ත බුද්දක පුත්‍රයා එලියට එන්න පඩියට අඩිය තිබ්බා. කෙලින් තිබ්බ බෙල්ල දකුණු පැත්තට කරකැවිලා දෙකට නැමිලා ගියේ නිරායාසයෙන්ම ද කියා ලපයාට ද තේරුනේ නැත.

මම උබට එන්න කිවුවේ වැදගත් කාරනාව කට..” මගෝඩිස්තුමා ගොරවයි. මගෝඩිස්, ලපයා, දොං සේතං,දැක්කොත් පද්මාවතී, සුවිටි, සිරිබිරිස් ඒ ඔක්කොම එක්ක පත්තර ඇතුලෙන් කැමිලස් පෙරේරා සිනාවෙයි. ගජමෑන්ට 52 යි කැමිලස්ට 78 යි මගේ අතේ 48 යි, ඒ කල්කිරි බෝතලේ ඉතුරු.

සිත්තර පත්තරය ආරම්භ වීමෙන් පසුව ගජමෑන් චරිතය සමාජගත විය. ගජමෑන් බොහෝ විට දුප්පතෙකු වූවත් එක චිත්‍ර කතාවක ගජමෑන් පට්ට පොහොසතෙකි. වරක් ඔහු තම මෝටර් රථය නවතා පුංචි සාදයකට යනවා. සාදය මාරයි දෙකක් තුනක් ගත්ත විට සිහිය හමාරයි කියලා හි තෙන්නේ සාදයේදී මධුවිත ගන්නා ගජමෑන් බැරි බැරි ගාතේ වෙරිමරගාතේ මීටරය කඩාගෙන මෝටර් රථයට නැග්ගා. මෙන්න යකෝ මේකා සුක්කානම නෑ, සුක්කානම නෑ, අනේ  හොරු අරගෙන ගිහින් කියා බෙරිහන් දෙයි. යටිගිරියෙන් යකා පලා යවයි. එහෙත් ඔබ මොබ කර හොයා බලන විට ගජමෑන් නැග තිබෙන්නේ මෝටර් රථයේ පසුපස ආසනයටය. පස්සේන් නැගලා අනාගෙන විකාගෙන බෙරිහන් දෙන එවුන් අදද අඩුත් නැත වැඩිත් නැතැයි බුද්දකගේ කුඩා මොලේ රිදුම් දෙයි. අද ගජමෑන් ත්‍රිමාණයෙන් මට ඔච්චම් කරයි. කුචි කවයි. ලපයා හිනාවෙයි.

කුඩා කැමිලස් චිත්‍ර අඳින්න දක්ෂයා. මුහුදු වැල්ලේත්, ගෙදර බිත්තිවලත්, පාසල් කළු ලෑල්ලේත් නිතර විකට රූප ඇන්දා. හොඳ වෙලාවට ඔහුගේ වැඩිහිටියෝ මේ දඟකාර වැඩවලට විරුද්ධ වුණේ නැහැ. හැකියාව දිගටම තියුණු කර ගන්න දිරි දුන්නා විතරයි. අද ඉන්න අම්මලා තාත්තලාට මෙය කදිම මග පෙන්වීමක්. හාස්‍ය රසය විශාදයෙන් පෙලෙන රෝගීන් සඳහා ප්‍රතිකාරාත්මක සුදුසු ක්‍රමයක් ලෙස යොදා ගන්න සුදුසු බව වරක් සායනික මනෝ විද්‍යාඥ පද්මාල් ද සිල්වා බුද්දකගේ කණට කොඳුරයි. කැපෙන පැත්තට උපහාස තිලකය තියන්න කැමිලස් දැඩි සමතෙක්. කැමිලස් පෙරේරා මිනිස් ළපැත්ත පිළිබඳ දොස්තරවරයෙක් යැයි මට හිතේ.

කැමිලස් එදා මෙදා තුර කිසි විටෙකත් රාජ්‍ය මට්ටමේ අගැයීමකට ලක් වී නැහැ. හොඳ වේලාවට එහෙම වුනේ කියලා හිතෙන්නේ වරක් චීනයට කැදවා ඇගයීමට ලක් කළා. කැමිලස් පෙරේරාගේ  නිර්මාණ ගැන ආසියාතික සහ බටහිර විද්වතුන් විචාරාත්මකව සොයා බලනවා. එහෙත් මගෝඩිස්ලට මනාප පළවූ රටක, රන්ගොපවරු පහලවූ යුග වල වසර 50කට අධික කාලයක් ලැබූ ජනතා ප්‍රණාමය ඉතා ඉහලයි. ඇත්තටම ජනතාවාදී කාටූන් ශිල්පීයෙකුට ලද හැකි පීවර සම්මානයත් එයයි. වසර 1966 පටන් විවිධ ප්‍රකාශනවලින් අප හිනස්සන, උපහාස ඔටුනු පලදන බුද්දකගේ මනස හොල්මන් කරපු, කුල්මත් කරපු, 77 හැවිරිදිව අද රටේ සිටින ජ්‍යෙෂ්ඨතම හා ජනප්‍රියතම විකට චිත්‍ර (කාටූන්) ශිල්පියකු වන කැමිලස් පෙරේරා සිත්තර දිවියේ තවමත් නිර්මාණ කරණයේ යෙදෙනවා.

“කැමිලස් යනු ලාංකික පත්තර කලාවේ අතිශයින්ම ප්‍රියජනක හා ජනාදරයට ලක් වූ නාමයක්. ඔහු මෙරට ජාතික පුවත්පත් හැම එකකටම පාහේ දායක වී තිබෙනවා. දේශපාලකයන් පමණක් නොව අප සැමගේ දුර්වලතා සියුම්ව උපහාසයට ලක් කරන්නට ඔහු ගජ හපනෙක්. සමහර චරිත කලන් අටට පනම් අටට බස්සන්න කැමිලස් සමත් වෙයි. සිත්තර පප්පා අපේ මධ්‍යම පාන්තිකයන් හා පහළ මධ්‍යම පාන්තික යන් ගැන කරන විග්‍රහයන් එක් අතකින් තියුණුයි. අනෙක් අතට සානුකම්පිතයි.” මට වරක් අජිත් සමරනායක කිවූ දෙයක් මගේ අක්මාව කොනිත්තයි.



කුරුකුලසූරිය එලිජියස් කැමිලස් පෙරේරා උපන්නේ 1939 දෙසැම්බර් 1 වනදා මීගමුවේදී. ලංකාවේ පුංචි රෝමය මෙරට පැහැදිළි උපසංස්කෘතියක් ඇති, බහුසංස්කෘතික නගරයක් වේ. කැමිලස්ගේ නිර්මාණවල මෙකී බහුසංස්කෘතික ගුණය තිබීම එනිසා පුදුමයක් නොවෙයි. ඔහු අපේ බහුසංස්කෘතික සිත්තර අධිකාරී ලෙස දශක කිහිපයක්  ජනතා ඉහල ප්‍රසාදතලයක් හිමි කර ගත්තා.

1970 කූපන් යුගයේ හෝ පෝලිම් යුගයේ පටන් ගජමෑන් හරහා අඳුනගන්න කැමිලස් ගේ විහිළු හරිම තත්කාලිනයි, සමයානුකූලයි. අපේ සෝමේ නැන්දා මැගිලින් අක්කා ගැන පැරණිම විහිළුව මතක් කරයි. පැරණිම විහිළුවක් මතක් කරමින්, මැගිලින් අක්කාව සිහි ගන්වයි. මැගිලින් අක්කා පොඩි දේවල් විශාල කර පෙන්වන  කණ්නාඩියකින් බිම බලයි. යමෙකු මැගිලින් අක්කා ගෙන් මොනාද බලන්නේ කියා අසයි. කූපන් එකට ගත්ත සීනි ඇට දෙක තුනක් බිම වැටුණා කියා ඇය කියන්නීය. මෙය සමගි පෙරමුණු රජය යටතේ කූපන් වලට බඩු ගත් යුගයේ විහිළුවකි. එකල්හි ආණ්ඩු කරපු අයගේ කන්‍යාරාමාධිපතිනියන් මතක් නොකර ඔබේ මවගෙන් මතක් කරගන්න, අසා දැනගන්න යැයි කියා බුද්දකගේ බොක්ක ඉකි ගසා හඩයි.

අපේ මාමා තවත් කථාවක මතක් කරයි. ඔන්න ගජමෑන් මිය ගොසිනි. වත්තේ පොල් මිලදී ගැනීමට එන පොල් මුදලාලි, පොල් ගස් කණාටු වෙලා කියයි. නමුත් එක් ස්ථානයක පොල් ගසක ගෙඩි සරුවට වැඩි තිබේ. මොකද බං ඒ හැමෝම කියවමින් විපරම් කරයි. ඒ ගස තිබ්බ තැන ගජමෑන් වලදැමූ ස්ථානයයි. මොකද මේ ගජමෑන් වලදැමූ ස්ථානයේ පොල්  ගෙඩි සරු කියා පොල් මුදලාලි අසන විට ගජමෑන් ගේ කොල්ලා කියන්නේ අපේ තත්තා ජීවත්ව හිටපු කාලයේ බිව්වේ යූරියා වලින් පෙරාපු කසිප්පු නිසා කියයි. ලිහිල් උපහාස කලාවේ සුමදුර සිත්තරා කැමිලස් ය. කැමිලස් පෙරේරා චාරුමත් මිනිසෙකි. චිත්‍ර අඳින්න හැකි බොහෝ අයට මෙසේ උපහාසාත්මක හැකියාව නැහැ. උපහාසයට හපන් අයට චිත්‍ර අඳින්න බැහැ. සමහරුන්ට මේ දෙකම නැත, මේ දෙකම තනි පුද්ගලයකු තුළ හමුවන්නේ කලාතුරකින්. හැබැයි අපේ නාලිකා තුල ඇග මිරිකාගෙන තුප්ප වචන හරුපයෙන් තටමන එවුන්ට කැමිලස් හීනියට උපහාස කලාවේ පාඩමක් කියා දෙයි.  කාටූන් චිත්‍ර ශිල්පීන් අපේ කාලයේ විශිෂ්ටතම සමාජ විචාරකයන් යැයි බුද්දකට සිහිනෙන් පෙනේ.

40 වන පිටට

From Page No. 08

“Hello! Are you there? In 5 minutes I will come back let us go for work.” Said one of the colleagues.

“O.K. give me 2 minutes I want to have a cup of coffee. I got up late and I didn’t have even my breakfast today” said Kasha. All those who were to go for work early morning came to see me before they left the common room. What a rush! What a queue ?Some are holding their cups and waiting in the queue.

People not only make tea and coffee with my water. They use it to prepare their noodles and pasta for their breakfast and lunch. What a great service I am doing. Not only that, they also prepare various drinks with my support.

Once Nisha who always talks about fresh food, brought some fresh mince leaves from the garden and crushed it, poured some hot water and made a jug of mince drink. I heard her shouting “Hello! Friends, come and enjoy this drink. Those who want must come immediately.” Again she announced “It is a very healthy drink. Good for diabetes and cholesterol. “Some ladies who were having complications came running with their mugs. Some enjoyed it while some only tasted. Sol and Abs had two drinks  each.

I hate the lunch time, because I have no rest at all during that hour. I don’t get enough time to get myself refreshed.  I need time to rest and get myself cool. Like humans I also need rest in between work. When I get stress who is going to counsel me. These friends when they have problems they get counselling. Not me. Why don’t these intelligent educated group of human beings understand that  I also like to enjoy a little bit of rest and relaxation.

Apart from this I don’t like  the behavior of  some of these people. I have observed many a times they don’t take any interest to keep me or my table clean. They are not aware of the fact that health comes first. I always like to stay in a clean and neat place. But very few are concerned about it and when they spill water on me and on the table I get really annoyed. Sometimes they even spill  tea and coffee over my body. Some ,after pouring water in to their mugs forget to close my mouth. I am concerned if dust or flies comes to embrace me I will have problems. If that happens how can I serve them.

I am surprised to see how some people consume 5 or 6 cups of tea a day. May be they are used to it. I can’t drink a single cup of tea though some say it is good for health. There are various types of tea here. I see black tea, green tea, lemon tea, ginger tea, mint tea, herbal tea, and various other varieties in different jars. So many varieties of coffee too can be seen. I have seen some people bring their own tea and coffee from home. One lady has brought her own small coffee pot also  from home. She doesn’t like me I suppose.

I have observed that the way people prepare tea and coffee. It is also different. Some people take tea with milk whereas some others take plain tea. Helva drinks tea with some sweets which he calls jaggery. He says this jiggery is  very expensive and he brings from his mother land. Sometimes he gives a small piece of jiggery to his close friends. Some of them drink tea with dates. Some add sugar to tea. The amount of sugar taken by them differs from one spoon to 3 spoons. Those who are careful of health dont take sugar at all.I have seen them add something to give the taste of sugar. Once I heard the veteran Nick who is suffering from diabetic advising others not to drink tea with sugar. Some people add flavours like  ginger ,cloves and cinnamon  to get a different taste.

The way people prepare coffee is also different. Ahm  takes about 10 minutes to prepare a cup of coffee. One day I saw Hali mixing sugar and coffee for 5 minutes. People who have come from different countries have different styles and methods in making coffee. Tea and coffee has a cultural context.

Once I saw Onis  making a special drink with my water. She took a pair of scissors and went to the garden and brought some pieces of lemon grass. Washed it well and put it to a mug. Poured hot water and kept it for few minutes. Then kept it on the front table with some mugs.

No sooner Bil saw it shouted “come brothers and sisters enjoy this healthy drink. Brothers and sisters finished it in no time.

“What a nice drink” said Abil then he called his friend Eve “come Eve just taste this drink”. Eve said after tasting the drink “ Oh !very tasty”

I heard someone saying ,"‘We should thank the Gardner for growing lemon grass here for us to use it like this".

When I heard it I felt so sad Just see they don’t consider how valuable I am .Without me how can they prepare any of these drinks, tea, coffee or lemongrass drink. They need to be grateful to me. Without me can they exist here? They should appreciate my service and be grateful to me too. I am the one who unite all these different personalities from different cultures. I observe how they sing, play cards, relate ghost stories from Christmas Island, share their food and enjoy in my room.

**Dr.P.Kudaligama**